# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## කොන්ත්‍රාත් පදනම මත ආරක්ෂක සේවක තනතුර

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින ආරක්ෂක සේවක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

(I). අට වෙනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

(II). ක්‍රීඩා හා සමාජ කටයුතුවල ක්‍රියාශීලී ලෙස සහභාගීත්වය තිබිය යුතුය.

(III). උස අඩි 5 අඟල් 4 ට නොඅඩු විය යුතුය. පපුව අඟල් 32 ට නොඅඩු විය යුතුය.

**වැටුප** : රු. 50,000.00 (සියලු දීමනා ඇතුළත්)

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**ප්‍රතිලාභ** : තෝරා ගන්නා අය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 8% ක ප්‍රමාණයක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 12% කට සමාන ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවනු ඇත. ඊට අමතරව ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 3% ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවනු ඇත.

**සටහන** : ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් සේවයේ නියුතුව සිටි අයට ප්‍රමුඛතාවය දෙන අතර සන්නද්ධ සේවාවක සේවා මුක්ත භටයින්ට ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**අයදුම් කළ යුතු ආකාරය :**

තමන් විසින් සකස් කරන ලද සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් අයදුම්පතක් සහතිකවල පිටපත්ද සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට 2023.05.17 දිනට පෙර ලැබෙන සේ තැපැල් මඟින් එවීමට හෝ පැමිණ භාරදීමට හැකිය. සහතිකවල පිටපත් සමඟ 2023.05.17 දිනට පෙර විශ්වවිද්‍යාලය වෙත ලැබෙන අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට සලකා බලනු ලැබේ.

**සැලකිය යුතුයි :** පුරප්පාඩු පවතින්නේ මෙම විශ්වවිද්‍යාලයේ නාවල පරිශ්‍රයේ පමණි.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ
2023.05.04